# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2041/21 – 2017 ඔක්තෝබර් මස 19 වැනි බ්‍රහස්පතින්දා – 2017.10.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/10/52/2012.

කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2013.08.15 දිනැති හා අංක 1823/63 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ* ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2013.07.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, දෙල්දූව පාර, අංක 59 හි පදිංචි එස්. එච්. හේමපාල මයා ඇතුළු සේවකයින් දහසය (16) දෙනා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 50 හි පිහිටි ලංකා විදුලිබල මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.08.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 ඔක්තෝබර් මස 10 දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05,

මගේ අංකය: අයිආර්/10/52/2012.

කාර්මික අධිකරණයේ දීය.

*එක් පාර්ශ්වයක් වශයෙන්,*
එස්. එච්. හේමපාල මහතා, ඇතුළු සේවකයින් දහසය (16) දෙනා, අංක: 59, දෙල්දූව පාර, මහ අම්බලන්ගොඩ, අම්බලන්ගොඩ.

නඩු අංකය : A/3517

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*
ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර ඇතිවූ කාර්මික ආරවුල.

1A – G 26441 – 14 (2017/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ප්‍රදානයයි

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් එස්. එච්. හේමපාල මහතා ඇතුළු ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින් 16 දෙනෙකු හා ලංකා විදුලිබල මණ්ඩලය අතරවූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2013.07.11 වන දින මා වෙත යොමු කරන ලදී. එසේම 2013.06.25 දාතමින් කම්කරු කොමසාරිස්වරයා විසින් යොමුකර ඇති ලිපියට අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කළ

01) එස්. එච්. හේමපාල
02) කේ. එච්. සිරිපාල
03) ජේ. ඩී. කරුණාසිරි
04) ජී. එස්. අබේවික්‍රම
05) ඩී. පී. ජයසාර
06) පී. එම්. බී. එස්. ලසන්තා
07) ඩී. වී. සිරිසේන
08) ආර්. එච්. ජයරත්න
09) ටී. ඩබ්. ප්‍රනාන්දු
10) එච්. ආර්. ඩී. ප්‍රනාන්දු
11) එස්. කරුණාරත්න
12) එච්. කේ. සෝමපාල
13) එච්. එම්. ටී. ඒ. බණ්ඩාර
14) එච්. විජේසෝම
15) පී. එස්. වාසලමුදලි
16) කේ. ජේ. ලයනල්

යන සේවකයින් දහසය දෙනාගේ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවා කාලයට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සේවා කාලය සැලකිල්ලට නොගැනීම නිසා ඔවුන්ට යම් අසාධාරණයක් සිදුවූයේද යන්න හා ඒ ලෙස අසාධාරණයක් සිදුවූයේ නම් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න මෙම පරීක්ෂණයේදී ම විසින් විමසා බැලිය යුතු කරුණ විය.

මෙම කාර්මික ආරවුලට අදාළ විස්තර ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසට දෙපාර්ශවයට දැනුම්දීමෙන් පසු 2013.09.13 ඉල්ලුම්කාර සේවක මහතුන් 16 දෙනාගේ නීතිඥ මහතා ඔවුන් වෙනුවෙන්ද 2014.03.10 වන දින ලංකා විදුලිබල මණ්ඩලයේ නීති නිලධාරිනිය විසින්ද විස්තර ප්‍රකාශ ගොනු කරන ලදී.

2014.03.18 වන දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේ වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් මූලික විරෝධතා ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටියේ කාර්මික ආරවුල් පනතේ 4 වන වගන්තිය යටතේ වූ කාර්මික ආරවුලක් ඉල්ලුම්කරුවන් හා ලංකා විදුලිබල මණ්ඩලය අතර නොමැති බවත්, ඒ නිසා මෙම ආරවුල විසඳීමට කාර්මික අධිකරණයට අධිකරණ බලයක් නොමැති බවත්ය. එම මූලික විරෝධතාවය සම්බන්ධයෙන් ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කරන ලෙස දෙපාර්ශවයට දැනුම් දෙන ලදී. දෙපාර්ශවයේ ලිඛිත සැලකිරීම් සැලකිල්ලට ගෙන 2014.08.08 වන දින මූලික විරෝධතාව පිළිබඳ නියෝගය ප්‍රකාශයට පත් කරන ලදී. කාර්මික ආරවුල් පනතේ කම්කරු ඇමතිවරයාට පැවරී ඇති බලතල යටතේ යම්කිසි ආරවුලක් නිරවුල් කිරීම සඳහා කාර්මික අධිකරණය වෙත යොමුකළ විට එම කරුණ විභාග කරනු විනා ප්‍රතික්ෂේප කිරීමට බලයක් නොමැති බවට මම තීරණය කරමි. තවද කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම් 2013.08.08 දින ලංකා විදුලිබල මණ්ඩල සභාපතිවරයා වෙත මෙම කාර්මික ආරවුල දන්වා තිබීම, ඊට විරෝධතාවයක් නොවූ බැවින් අංක 1823/60 *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් මෙම කාර්මික ආරවුල ප්‍රසිද්ධ කර තිබීම යන කරුණුද සැලකිල්ලට ගෙන මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කළෙමි. දෙපාර්ශවය අතර කාර්මික ආරවුලක් පවතින්නේද සේවකයින් දහසය දෙනාට අසාධාරණයක් සිදුවී ඇද්ද යන්න තීරණය කළ යුත්තේ සාක්ෂි විමසීමකින් පසුව බවට නිගමනය කළෙමි.

ඒ අනුව 2014.10.17 දින සාක්ෂි විමසීම ආරම්භ කරන ලද අතර එදින ඉල්ලුම්කරුවන්ගෙන් කෙනෙකු වූ එස්. එච්. හේමපාල මහතා සිය මූලික සාක්ෂිය ලබාදෙන ලද අතර, 2015.03.12, 2015.08.07 හා 2015.09.05 යන දිනවලද මූලික සාක්ෂි ලබා දී සාක්ෂි අවසන් කරන ලදී. එම මූලික සාක්ෂියේදී රජයේ විදුලි දෙපාර්තමේන්තුව 1968.07.19 වන දින සාක්ෂිකරු එම දෙපාර්තමේන්තුවේ වෘත්තීය ආධුනික තනතුරට පත් කිරීමේ ලිපිය A1 ලෙසද, එම ලිපියේ අංක 6 යටතේ සඳහන් මෙම දෙපාර්තමේන්තුව මණ්ඩලයක් හෝ සංයුක්ත මණ්ඩලයක් බවට පත් වුවහොත් එවිට ඔබ එම මණ්ඩලය හෝ සංයුක්ත මණ්ඩලයට මාරු කරනු ලබනවාත් හැර ඔබට සේවා කොන්දේසි අහෝසි කිරීමේ වාසි හිමි නොවනු ඇත යන කොටස A1 අ ලෙසද, රජයේ විදුලි දෙපාර්තමේන්තුව 1969.09.11 වන දින සාක්ෂිකරු

තුන්වන පන්තියේ කම්කරු තනතුරට පත් කරන ලද ලිපිය A2 ලෙසද, ලංකා විදුලිබල මණ්ඩලය 1970.11.01 දින සිට තුන්වැනි පන්තියේ කම්කරු තනතුරට පත් කිරීමේ ලිපිය A3 ලෙසද, සාක්ෂිකරුට පාරිතෝෂිත/ පාරිතෝෂිත ගෙවීම පිළිබඳ සහතික A4 ලෙසද, ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

එස්. එච්.හේමපාල මහතා සාක්ෂි දෙමින් සිටියදී මතුවූ ගැටළුවක් වූයේ ඔහු කාර්මික අධිකරණයෙන් බලාපොරොත්තුවන සහනයන් මොනවාද යන්නයි. සාක්ෂිකරු රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සේවය කළ සේවා කාලය විදුලිබල මණ්ඩලයේ සේවා කාලයට එකතු නොකිරීම නිසා විදුලිබල මණ්ඩලයේ වසර 40 ක් සම්පූර්ණ කළ සේවකයින්ට ලබාදුන් රන් තිළිණය නොලැබීම නිසා අසාධාරණයක් සිදු වූ බව ප්‍රකාශ කරන ලදී. මෙම සාක්ෂිකරු සාක්ෂි දෙමින් සිටියදී ඔහු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා ඉල්ලා සිටියේ ඉල්ලුම්කරුවන් කාර්මික අධිකරණයෙන් බලාපොරොත්තු වන අනෙකුත් සහන සම්බන්ධයෙන් අධිකරණයේ අවධානය යොමු කිරීම සඳහා ඒ අවස්ථාවේදී ලිඛිත දේශනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන ලෙසය. එසේ ලිඛිත දේශනයක් ගොනු කිරීම පිළිබඳව වගඋත්තරකාර පාර්ශවයේ විරෝධය පළ කරන ලද අතර අධිකරණයද ඒ අවස්ථාවේදී එවැනි ලිඛිත දේශනයක් බාර ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. කෙසේ වුවද සාක්ෂිකරු සිය සාක්ෂි අවසානයේදී රන් තිළිණය ලබා නොදීමේ කාරණයට අමතරව විදුලිබල මණ්ඩලයේ සේවා කාලයට විදුලි දෙපාර්තමේන්තුවේ සේවා කාලය ගණන් නොගැනීම නිසා එම කාලයට අර්ථ සාධක මුදල් නොලැබීම, පාරිතෝෂිත මුදල් නොලැබීම නිසා අසාධාරණයක් සිදුවූ බවත් ඒ සම්බන්ධයෙන්ද සහන ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. විදුලිබල මණ්ඩලය එම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්ණද අසන ලදී.

එස්. එච්. හේමපාල මහතාගේ සාක්ෂියන් පසු ඉල්ලුම්කරුවන් 16 දෙනාගෙන් කෙනෙකු වන ජයමහ මුදලිගේ දෙන් කරුණාසිරි මහතා සාක්ෂියට කැඳවන ලදී. ඔහු සිය සාක්ෂියේදී ලංකා විදුලි දෙපාර්තමේන්තුව 1968.07.07 දින වෘත්තීය ආධුනිකයන් ලෙස පත් කරන ලද ලිපිය A5 ලෙසද, 1969.09.15 දින කම්කරු තනතුරට පත් කරන ලද ලිපිය A6 ලෙසද, ලකුණු කර ඉදිරිපත් කරන ලදී. එසේම 1970.11.01 දින ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිගේ අත්සනින් නිකුත් කරන ලද සාක්ෂිකරු තුන්වැනි ශ්‍රේණියේ කම්කරු තනතුර සඳහා පත් කරන ලද ලිපිය A7 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. සාක්ෂිකරු සිය සාක්ෂියේදී A8 ලෙස 2010 වසරේ සේවක අර්ථ සාධක අරමුදල් ගෙවීමට අදාළ ලිපිය ඉදිරිපත් කරමින් ප්‍රකාශ කළේ අර්ථ සාධක මුදල අඩුවෙන් ගණනය කර ඇති බවය. ඊට අමතරව විදුලිබල මණ්ඩලයේ සාක්ෂිකරුට පිරිනමන සේවා උපහාර සහතිකය A9 ලෙස ලකුණු කර ඉදිරිපත් කරමින් (1999.10.25) රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ හා ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් වසර 30 සේවය අගය කරන බව එහි සඳහන් බව ප්‍රකාශ කළේය. තමන්ට සේවක අර්ථ සාධක අරමුදලට වසරකුත් දවස් 10 ක කාලයක් අඩුවීම පාරිතෝෂිතය වසර දෙකක් අඩුවීම හා රන් තිළිණය නොලැබීම තමන්ට සිදුවූ අසාධාරණයන් බව ඔහු සඳහන් කළේය.

2017.03.17 දින එම සාක්ෂිකරුගේ හරස් ප්‍රශ්න ඇසීමට නියමිතව තිබූ අතර එදින වගඋත්තරකාර පාර්ශවය අධිකරණයට ප්‍රකාශ කළේ මෙම නඩුව කඩිනමින් අවසන් කිරීමේ සංකල්පය මත අදාළ ලේඛන සමග ලිඛිත සැලකිරීම ඉදිරිපත් කිරීමට යෝජනා කරන බවය. ඉල්ලුම්කාර පාර්ශවයද මෙම යෝජනාවට එකඟ වන බව ප්‍රකාශ කළේය. ඒ අනුව දෙපාර්ශවයට ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දුන්නෙමි. ඉල්ලුම්කාර පාර්ශවය 2017.05.19 වන දින ලේඛන සමඟ ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කරන ලද අතර දෙවන පාර්ශවය වන විදුලි බල මණ්ඩලය 2017.07.05 වන දින ලේඛන සමඟ ලිඛිත සැලකිරීම් ඉදිරිපත් කරන ලදී. අනතුරුව දෙවන පාර්ශවය 2017.07.12 වන දින අධිකරණයට Memorandum නමින් ලියවිල්ලක් ඉදිරිපත් කරමින් 2017.07.05 වන දින ඉදිරිපත් කරන ලද ලිඛිත සැලකිරීම ඉවත් කර ගන්නා බවත්, මෙම නඩුව වැඩිදුර විභාගය සඳහා නියම කරන ලෙසත් ඉල්ලා සිටියේය. මෙම ආරවුල විසඳීම සඳහා මෙම අධිකරණයට යොමුවී වසර හතරකට අධික කාලයක් ගතවී ඇති නිසාත් ආරම්භයේ සිටම විදුලිබල මණ්ඩලයේ මෙම නඩුව සම්බන්ධයෙන් උනන්දුවකින් කටයුතු කර නොතිබූ නිසාත් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර නඩු කටයුතු අවසන් කිරීමට තීරණය කළෙමි.

පළමු පාර්ශවයේ බලයලත් නියෝජිත මහතා සිය ලිඛිත සැලකිරීම් ද පහත සඳහන් ඉල්ලුම්කරුවන්ට අදාළ ලේඛනද ඉදිරිපත් කරමින් ඔවුන්ට සිදුවී ඇතැයි කියන අසාධාරණයන්ට සහන අයැද ඇත.

01) එස්. එච්. හේමපාල
02) ජේ. ඩී. කරුණාසිරි
03) ආර්. එච්. ජයරත්න
04) එච්. කේ. සෝමපාල
05) ඩී. පී. ජයසාර
06) එච්. ආර්. ඩී. ප්‍රනාන්දු
07) කේ. ජේ. ලයනල්
08) ඩී. වී. සිරිසේන
09) එච්. ඩබ්ලිව්. ද සිල්වා
10) ටී. ඩබ්ලිව්. ප්‍රනාන්දු
11) ජී. එස්. අබේවික්‍රම
12) කේ. එච්. සිරිපාල
13) පී. එම්. බී. එස්. ලසන්ත
14) පී. එස්. වාසලමුදලි

මුලින්ම සඳහන් කළයුතු කරුණ වන්නේ නඩු විභාගයේදී ඒ අය අතරින් සාක්ෂි දෙන ලද්දේ එස්. එච්. හේමපාල හා ජේ. ඩී. කරුණාසිරි යන දෙදෙනා පමණක් බවයි. ඔවුන් සාක්ෂි දෙන අවස්ථාවේ ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ එම ඉල්ලුම්කරුවන් දෙදෙනාට අදාළ ලේඛන පමණි. සෙසු ඉල්ලුම්කරුවන් අතරින් කිහිපදෙනෙකු වරින්වර විභාග අවස්ථාවේ පැමිණියේ නමුදු ඔවුන් කිසිවෙකු සාක්ෂිදීම සඳහා නොකැඳවන ලද අතර ඔවුන්ට අදාළ ලේඛන ලකුණු කර ඉදිරිපත් කළේද නැත. එසේ වුවද එම ඉල්ලුම්කරුවන් වෙනුවෙන් සහන බලාපොරොත්තුවෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා සිය ලිඛිත දේශනයේ ඔවුන් වෙනුවෙන්ද කරුණු දක්වා ඇති අතර ඔවුන්ට අදළ ලේඛනද X වශයෙන්ද ලකුණු කර ඉදිරිපත් කර ඇත. එම ඉල්ලුම්කරුවන්ට අදළ ලේඛන ප්‍රථමවරට අධිකරණය හමුවට යොමු වන්නේ එම ලිඛිත දේශණයත් සමගය. එම ලේඛන කිසිවක් නඩු විභාගයේදී ලකුණු නොකළා පමණක් නොව එම ලේඛන පිළිබඳ හරස් ප්‍රශ්ණ ඇසීමට අනෙක් පාර්ශවයට අවස්ථාවක් ලැබුණේ නැත. එවැනි තත්වයක් යටතේ එම ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් පිළිබඳ සලකා බැලීමට හැකියාවක් නොමැත. ඒ අනුව අධිකරණය හමුවේ සාක්ෂි දුන් එස්. එච්. හේමපාල සහ ජී. ඩී. කරුණාසිරි යන ඉල්ලුම්කරුවන් දෙදෙනාගේ ඉල්ලීම් හැර අනෙකුත් ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම් පිළිබඳ සලකා නොලැබීමට තීරණය කරමි.

එස්. එච්. හේමපාල නැමැති ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කරන ලද්දේ ඔහු ලංකා විදුලි දෙපාර්තමේන්තුවේ සේවය කළ කාලය විදුලිබල මණ්ඩලයේ සේවා කාලයට එකතු නොකිරීම නිසා ඔහුට අසාධාරණයක් සිදුවී ඇති බවයි. ඒ හේතුව නිසා ඔහුට ලැබිය යුතු සහන කිහිපයක්ම නොලැබී ගිය බවය. ඔහු සිය සාක්ෂියේදී A1, A2, A3, A4 යන ලේඛන ලකුණු කර ඉදිරිපත් කරන ලද අතර විදුලිබල මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටි නීතීඥවරයාද ඔහුගෙන් හරස් ප්‍රශ්ණ අසන ලදී. ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ඉහත කී ලේඛන පිළිබඳ අවධානය යොමු කරමි.

A1 - ඉල්ලුම්කරු 1968.08.16 වන දින රජයේ විදුලි දෙපාර්තමේන්තුවට වෘත්තීය ආධුනික තනතුරට පත් කරන ලද ලිපිය වේ.

A2 - ඉල්ලුම්කරු 1969.09.15 වන දින සිට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ තුන්වන පන්තියේ කම්කරු තනතුරට පත් කරන ලද ලිපිය වේ.

A3 - ඉල්ලුම්කරු ලංකා විදුලිබල මණ්ඩලය 1970.11.01 සිට තුන්වන ශ්‍රේණියේ කම්කරු තනතුරට පත් කරන ලද ලිපිය වේ.

A1 ලේඛනය පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ එම ලිපිය අනුව ඉල්ලුම්කරු අවුරුද්දක පුහුණු කිරීම සඳහා වෘත්තීය ආධුනිකයෙකු ලෙස තෝරාගත් බවයි. A2 ලේඛන අනුව ඉල්ලුම්කරු 1969.09.15 වන දින සිට වැඩ බැලීමේ පදනම මත තුන්වන පන්තියේ කම්කරු තනතුරට පත්කර තිබෙන ලේඛනයක් බවයි. එම ලේඛන දෙකින්ම පැහැදිලි වන්නේ ඉල්ලුම්කරු ස්ථිර සේවකයෙකු ලෙස බඳවාගෙන නොමැති බවයි. පරීක්ෂණ කාලයකට යටත් කර ඉල්ලුම්කරුට ස්ථිර සේවකයෙකු ලෙස පත්වීමක් ලැබී ඇත්තේ විදුලි දෙපාර්තමේන්තුව විදුලි බල මණ්ඩලය බවට පත්කිරීමෙන් පසු 1970.11.01 දින සිට තුන්වන පන්තියේ කම්කරු තනතුරට පත් කිරීමේ ලිපියෙනි. A3 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති එම ලිපියේ සේවක අර්ථ සාධක අරමුදලට ඔහුගේ වැටුපෙන් මුදල් අඩු කිරීමට මණ්ඩලය එම අරමුදලට දායක වීම පිළිබඳ විස්තර අඩංගු වේ. A1 සහ A2 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති ලිපිවල අර්ථසාධක අරමුදල් සම්බන්ධ කිසිදු සඳහනක් නැත. ඒ අනුව ඉල්ලුම්කරුගෙන් හා මණ්ඩලයෙන් අර්ථසාධක අරමුදලට දයක මුදල් අඩුකර ඇත්තේ 1970.11.01 දින සිට විදුලිබල මණ්ඩලයේ තුන්වන පන්තියේ කම්කරු තනතුරට පත් කිරීමෙන් පසුවය. ඉල්ලුම්කරු 1970.11.01 දිනට පෙර විදුලි දෙපාර්තමේන්තුවේ වෘත්තීය ආධුනික තනතුර හා තුන්වන පන්තියේ කම්කරු තනතුර දරූ කාලයේ විදුලිබල මණ්ඩලයේ සේවා කාලයට එකතු නොවන බවට විදුලිබල මණ්ඩලය දරන ස්ථාවරය පිළිගැනීමට සිදුවේ. තවද විදුලි දෙපාර්තමේන්තුවේ සේවය කළ සේවකයින් විදුලිබල මණ්ඩලයේ සේවකයින් ලෙස ඇතුළත් කර ගන්නා ලද බව දක්වෙන ලේඛනයක් ඉල්ලුම්කාර පාර්ශවයෙන් ඉදිරිපත් වූයේද නැත. මෙම ඉල්ලුම්කරුගේ සාක්ෂියේදී ලකුණුකර ඉදිරිපත් කර ඇති අර්ථසාධක අරමුදල් ආපසු ලබා ගැනීමේ ලේඛනය අනුව ඉල්ලුම්කරුගේ හා මණ්ඩලයේ අර්ථසාථක අරමුදලට දයක මුදල් අඩුකර ඇත්තේ 1970.11.01 දින සිට බව පැහැදිලි වේ. අර්ථ සාධක අරමුදල සමන්විත වන්නේ සේවක සේවා දෙපාර්ශවයේ දයක වන මුදල් වලිනි. 1970.11.01 දිනට පෙර එසේ මුදල් ගෙවීමක් සිදුවී නොමැති නම් එහි ප්‍රතිලාභයන් ලබා ගැනීමේ හැකියාවක් නොමැත. A3 ලේඛනයෙන් පැහැදිලි වන්නේ විදුලිබල දෙපාර්තමේන්තුවේ තුන්වන පන්තියේ කම්කරු තනතුර දරූ ඉල්ලුම්කරු විදුලිබල මණ්ඩලය පිහිටුවීමෙන් පසු නැවතත් තුන්වන පන්තියේ කම්කරු තනතුරකට පත්කර ඇති බවයි. කලින් සේවය කළ වැඩ බැලීමේ කම්කරු තනතුර දරූ ඉල්ලුම්කරු පරීක්ෂණ කාලයකට යටත් කර ස්ථිර කම්කරු තනතුරකට පත් කිරීම සිදුකර ඇත්තේ 1970.11.01 දින සිටය. ඒ අනුව ඉල්ලුම්කරු 2009.12.26 දින විශ්‍රාම යනවිට වසර 40 ක කාලයක් සම්පූර්ණ කළ සේවකයෙකු හැටියට සැලකිය නොහැක. ඉහත කරුණු සියල්ල සලකා බලන විට ඉල්ලුම්කරු ඉල්ලා ඇති සහන ප්‍රදානය කිරීමට නොහැකි බවට තීරණය කරමි.

ඉල්ලුම්කරුවන් අතරින් ජේ. ඩී. කරුණාසිරි මහතා 2016.09.27 වන දින සාක්ෂි ලබාදෙන ලදී. ඔහු සිය සාක්ෂියේදී 1968.08.16 දින සිට වෘත්තීය ආධුනිකයෙකු ලෙස රජයේ විදුලි දෙපාර්තමේන්තුවට බඳවා ගත් ලේඛනය A5 වශයෙන් ලකුණු කර ඉදිරිපත් කළ අතර, 1969.09.05 දින සිට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ තුන්වන පන්තියේ කම්කරු තනතුරට බඳවා ගැනීමේ ලේඛනය A6 ලෙස ලකුණු කර ඉදිරිපත් කළේය. A7 ලෙස ලකුණු කර ඉදිරිපත් කළ 1970.11.01 දින සිට සාක්ෂිකරු ලංකා විදුලිබල මණ්ඩලයේ තුන්වන පන්තියේ කම්කරු තනතුරකට පත් කිරීමේ ලිපියයි. එම ලේඛන පරීක්ෂා කිරීමේදීද පෙනී යන්නේ ඉල්ලුම්කරු විදුලිබල මණ්ඩලයේ ස්ථිර තනතුරකට බඳවාගෙන ඇත්තේ 1970.11.01 දින සිට බවය. 2010.01.28 දින ඔහු විශ්‍රාම ගොස් ඇති අතර විශ්‍රාම ලබනවිට විදුලිබල මණ්ඩලයේ වසර 40 ක් සම්පූර්ණ කළ සේවකයෙකු නොවේ. A8 ලෙස ලකුණු කර ඇති අර්ථසාධක අරමුදල් ආපසු ගෙවීමේ ලේඛනය අනුව මෙම ඉල්ලුම්කරුගේද අර්ථ සාධක අරමුදලට මුදල් අයකර ඇත්තේද මණ්ඩලය දයක වී ඇත්තේද 1970.11.10 දින සිටය. එදින සිට

ගණනය කර අර්ථ සාධක මුදල් ඉල්ලුම්කරුට ආපසු ගෙවා ඇත. 1970.11.10 දිනට පෙර ඉල්ලුම්කරු අර්ථ සාධක මුදලකට දයක වී නොමැති බව A5 සහ A6 ලේඛනවලින් පැහැදිලි වේ.

ඉල්ලුම්කරු සිය මූලික සාක්ෂියේදී A9 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද සේවා උපහාර සහතිකය පිළිබඳ අවධානය යොමු කළෙමි. සභාපති, විදුලිබල මණ්ඩලය, 1999 ඔක්තෝබර් 25 දින ඉල්ලුම්කරුට ලබාදී ඇති එම සහතිකයේ සඳහන් වන්නේ වසර 30ක් විදුලි දෙපාර්තමේන්තුවේ හා ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් කැප කිරීම වෙනුවෙන් එම සහතිකය පිරිනමන බවයි. විදුලි දෙපාර්තමේන්තුවේ සේවා කාලය විදුලිබල මණ්ඩලයේ සේවා කාලයට එකතුවූ බව සනාථවීමට එම සහතිකය ප්‍රමාණවත් සාධකයක් නොවන බවට තීරණය කරමි. තවද මෙම ඉල්ලුම්කරු වෙනුවෙන් කරුණු දක්වීමේදී A5 ලේඛනයේ අංක 6 යටතේ සඳහන් කර ඇති " මෙම දෙපාර්තමේන්තුව මණ්ඩලයක් හෝ සංයුක්ත මණ්ඩලයක් බවට පත් වුවහොත් එවිට ඔබ එම මණ්ඩලයේ හෝ සංයුක්ත මණ්ඩලයට මාරු කරනු ලබනවාත් හැර ඔබට සේවා කොන්දේසි අහෝසි කිරීමේ වාසි හිමි නොවනු ඇත. "යන සඳහන මගින් දෙපාර්තමේන්තුවේ සේවා කාලය මණ්ඩලයේ සේවා කාලයට ඇතුළත් වන බවක් ගම්‍ය වන්නේ නැති බවට තීරණය කරමි.

ඒ අනුව එස්. එච්. හේමපාල හා ජේ. ඩී. කරුණාසිරි යන ඉල්ලුම්කරුවන් දෙදෙනාගේ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවා කාලයට රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සේවා කාලය සැලකිල්ලට නොගැනීම නිසා ඔවුනට අසාධාරණයක් සිදු වී නොමැති බවටත් තීරණය කරමි.

බේරුම්කරු

2017 අගෝස්තු 11 වන දින දීය.

11-190

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.